**නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය - 2014**

**-------------------------------------------------------------------**

නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹි 2009 ඔක්තෝබර් 22 දිනැති අංක 2546 -එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------------**

නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, නැගෙනහිර පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සඳහා පැවරී තිබුණි. පළාත් මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම මඟින් නැගෙනහිර හා උතුරු මැද පළාත් ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම හා නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලවල භෞතික සම්පත් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 78 ක් වන අතර ඉන් එජඩො මිලියන 70 ක් එනම් සියයට 89.74 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන එජඩො මිලියන 8 ක් එනම් සියයට 10.26 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කළ යුතුය. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 මාර්තු 20 දින ආරම්භ කර තිබූ අතර 2014 ජුනි 30 වන විට නිම කිරීමට නියමිත විය. ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2015 මාර්තු 15 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

## 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අතුරු ගෙවීම් සහතික මඟින් 2013 වර්ෂයේදී රු.මිලියන 13.38 ක හා රු.මිලියන 9.74 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද පිළිවෙලින් මෝටර් වාහන 02 ක් හා පර්යේෂණ උපකරණ වැනි වත්කම් සහ 2014 වර්ෂයේදී රු.මිලියන 9.74 ක පිරිවැයකට උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ශ්‍රවණාගාරයේ ප්‍රයෝජනය සඳහා ප්‍රසම්පාදනය කරන ලද වෙනත් උපකරණ ව්‍යාපෘතියේ දේපල ලෙස ගිණුම්ගත කරනු වෙනුවට සිවිල් වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 312.28 ක් වූ වර්ෂය තුළ කරන ලද ඌන පූරණය කිරීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යන වාර්තාවල දැක්වුණ රු.මිලියන 272.71 ක් හා රු.මිලියන 193.77 ක් වූ අනුරූපී සංඛ්‍යා සමඟ එකඟ වී නොතිබුණි. ශේෂයන් සැසඳීම සඳහා ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම** | **උපයෝජනය කළ අරමුදල්** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 70 | 7,980 | 728 | 4.12 | 540 | 55.56 | 7,279 |
| ශ්‍රී ලං ර | 08 | 912 | 121 | 0.92 | 121 | 7.93 | 1,040 |
| එකතුව | 78 | 8,892 | 849 | 5.04 | 661 | 63.49 | 8,319 |

ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය මාස 09 කින් දීර්ඝ කර තිබීම හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත කාලපරිච්ඡේදයෙන් සියයට 95 ක් ඉක්මවා ගොස් තිබුණද ණය මුදලින් සියයට 80 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, උතුරු මැද පළාතේ පළාත් මාර්ග 19 ක හා නැගෙනහිර පළාතේ පළාත් මාර්ග 17 ක මාර්ග පුනරුත්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබූ අතර, අදාළ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් මාර්ග සංවර්ධන අධිකාරිවලට භාර දී තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

කොන්ත්‍රාත් ගිවිසුම් අනුව, ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල නඩත්තු වැඩ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරි වර්ෂ 03 සඳහා සිදුකිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල නඩත්තු කිරීම පිළිබඳ අවශ්‍යතාවය ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඉස්මතුකොට ප්‍රමාණවත්ව දක්වා නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලංසුකරුවන් විසින් ඔවුන්ගේ ලංසු ලියකියවිලි මාර්ග නඩත්තු කටයුතු සඳහා අඩු රේටයන් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂණයේදී, මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 0.25 සිට සියයට 2.31 දක්වා ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග 19 ක් නඩත්තු කිරීම සඳහා වෙන්කර තිබූ බව අනාවරණය විය.

තවද 2015 මැයි හා අගෝස්තු මාසයේදී විගණකවරුන් විසින් කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී උතුරු මැද පළාතේ ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද පොතාන - ඉහළගම මාර්ගය, ගුරුගල්හින්න - ඇල්ල පොතාන - වළහා විද්ද වැව මාර්ගය, පරසන් ගස් වැව - කටුකෙලියාව මාර්ගය හා ඔයාමඩුව - තන්තිරිමලේ මාර්ගය යන මාර්ගවල ස්ථාන කිහිපයක ගිලා බැසීම් හා වෙනත් දෝෂ අනාවරණය විය. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පැහැදිලි කිරීමට අනුව, පුනරුත්ථාපන වැඩ නිම කිරීමෙන් පසු මාර්ග නඩත්තු කිරීම් වැඩ කොන්ත්‍රාත්කරුවන් විසින් සතුටුදායකව ක්‍රියාත්මක කර නොතිබූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග ස්ථාන කිහිපයක දෝෂ දක්නට වූ බවත් සඳහන් කර තිබුණි.

එබැවින් මාර්ග නඩත්තු කාර්යයන් සඳහා ලංසු ලියකියවිලි ප්‍රමාණවත් වෙන්කිරීම් කර නොතිබූ බැවින් මාර්ග නඩත්තු වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ නොවූ බව පැහැදිලි වේ. තවද දෝෂ වගකීම් කාලය තුළදී කොන්ත්‍රාත්කරුවන් නියාමනය කිරීම සඳහා හා තිරසාර ආකාරයෙන් මාර්ගවල තත්ත්වය තහවුරු කර ගැනීමට පිළියම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව ඒ අනුව පැහැදිලි වේ.